මොරටුව මහා නගර සභාව

**කොළඹ දිස්ත්‍රික්කය**

**----------------------**

**1.** මූල්‍ය ප්‍රකාශන

**----------------**

**1.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම**

**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 12 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2** තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**----------------------------------------**----

1.3.1 **අසම්භාව්‍ය බැරකම්**

**-------------------------**

බාහිර පාර්ශවයන් විසින් මොරටුව මහා නගර සභාවට එරෙහිව පවරා ඇති නඩු 10 ක් හා සභාව විසින් බාහිර පාර්ශවයන්ට එරෙහිව පවරා ඇති නඩු 06 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

**----------------------**

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන / වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.13,433,866 ක වෙනසක් පැවතුණි.

(ආ) සේවක ඇප තැන්පත් ගිණුම හා සේවක ඇප පොලී ගිණුමේ ශේෂයන්ගේ එකතුව සේවක ඇප ආයෝජන ගිණුමේ ශේෂයට සමාන විය යුතු නමුත් 2017 දෙසැම්බර් 31 දිනට එම ගිණුම් ශේෂ අතර වෙනස රු.25,297 ක් විය.

**1.3.3** **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

**(අ)** **ලැබිය යුතු ගිණුම්**

------------------

(i) පානදුර ප්‍රාදේශීය සභාවේ කසළ, කරදියාන කසළ අංගනය වෙත බැහැර කිරීම වෙනුවෙන් 2012 සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව එම සභාවෙන් ලැබිය යුතු රු.

1,303,203 ක මුදල හා ඊට අදාල රු. 172,283 ක බදු මුදල සමඟ රු.1,475,486 ක හිඟ මුදලක් සමාලෝචිත වර්ෂය තුළද අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ii) වීථි පහන් නඩත්තු කිරිම වෙනුවෙන් ලංකා විදුලි (පුද්ගලික) සමාගමෙන් ලැබිය යුතු රු.10,140,025 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපූර්ණය නොකිරීම නිසා සභාවට ලැබිය යුතු එම මුදල නිරවුල් කර ගැනීම සම්බන්ධව ඉදිරි ක්‍රියාමර්ග ගෙන නොතිබුණි.

(iii) වර්ෂ ගණනාවක සිට පැවත එන වරිපනම් බදු වංචා කිරීමෙන් සිදු වූ අලාභය වන රු. 381,969 ක ශේෂය මූලා ප්‍රකාශනවල ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණද අලාභයෙන් රු. 241,749 ක් නිලධාරියා විශ්‍රාම යන අවස්ථාවේ අයකර ගැනීමට 2011.02.14 දින විනය නියෝගයක් ලබාදී තිබුණි. එය මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iv) ලැබිය යුතු හිඟ ඉන්ධන ශේෂය රු. 455,167 ක් වූ අතර එම වටිනාකමෙන් රු. 371,167 ක් හෙවත් සියයට 81.54 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(v) 1999 සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල මස් වෙළඳසැල්වලින් ලැබිය යුතු කුලී රු. 645,055 ක මුදල සමාලෝචිත වර්ෂය තුළද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) 2000 ජනවාරි 20 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක LG /3/ 2000 දරන චක්‍රලේඛය ප්‍රකාරව විනෝද බදු මුදල් සියයට 10 දක්වා අඩු කිරීම නිසා සභාවට අහිමි වූ රු. 3,228,197 ක් වූ විනෝද බදු මුදල ලැබිය යුතු මුදලක් ලෙස ආදායම් ණයගැතියෝ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(vii) 2014 වර්ෂයේ සිට පැවත එන ලැබිය යුතු තානායම් ගාස්තු රු. 526,500 ක් සමාලෝචිත වර්ෂය තුළද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(viii) රු. 545,411 ක් වූ අගරු චෙක්පත් ශේෂය තුළ ඇතුලත් 2008 සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු. 506,828 ක් වටිනා චෙක්පත් 90 න් මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද සභාව කටයුතු කර නොතිබුණි.

(ix) 2000 සිට 2017 දක්වා කාලපරිච්ඡේදයට අදාළ රු. 1,293,191 ක පෙර ගෙවුම් ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

**--------------------**

මූලා ප්‍රකාශනවල වර්ෂ ගණනාවක සිට පැවත එන සංවර්ධන සංචිතය රු.10,000 ක් සහ නිදන් අරමුදල් ශේෂය රු. 89,210 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හඳුනාගෙන නිරවුල්කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**---------------------------------------------------**

**විස්තරාත්මක උපලේඛන, කාල විශ්ලේෂණ හා තොග සත්‍යාපන වාර්තා ඉදිරිපත් නොකිරීම නිසා** එකතුව රු. 25,169,542 ක් වූ ගිණුම් විෂයයන් 10 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **(රු).** | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| **(i)** | මු.රෙ. 104 (2) | 231,000 | සමාලෝචිත වර්ෂය තුළ සිදු වූ වාහන අනතුරු 03 ක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා වෙත වාර්තා කර නොතිබුණි. |
| **(ii)** | මු.රෙ. 156 | 732,071 | වගකීමෙන් තොරව කටයුතු කරන නිලධාරීන් මත රජයට සිදු වන අලාභ අධිභාර කළයුතු වුවත් 2015, 2016 හා 2017 වර්ෂවල සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා යැවීම හා දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත අධිභාර ගෙවීම නිසා සභාවට සිදු වී ඇති අලාභය 2017 වර්ෂය අවසාන වන විටත් ඊට වගකිව යුතු අයගෙන් අයකර ගෙන නොතිබුණි. |
| **(iii)** | මු.රෙ. 371(2) හා (5) | 188,402 | නිකුත් කරන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ වහාම හෝ වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් කළ යුතු වුවත් 2000 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාගත් අත්තිකාරම් පියවා නොතිබුණි. |
| **(iv)** | මු.රෙ.396 (ඈ) | 12,759 | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ වලංගු කාල සීමාව ඉක්ම වූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(v)** | මු.රෙ.570 හා 571 | 9,066,794 | වර්ෂ 02 ක් ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| **(vi)** | මු.රෙ 756 | 372,765,151 | ස්ථාවර වත්කම් සහ තොග සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(vii)** | මු.රෙ. 1646 | - | සභාවට අයත් වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මස 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | සභාව සතු වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. |

### 1.3.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

මහා නගර සභා ආඥාපනතේ (252 අධිකාරය) 188 (1) උපවගන්තියෙන් ප්‍රතිපාදන සැලසී නොමැති සභාවේ සභිකයන් 27 දෙනෙකු වෙනුවෙන් හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් සඳහා සභා අරමුදලින් 2015 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් රු. 629,690 ක් හා රු.1,059,832 ක් ගෙවීම් කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 36,705,215 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 65,914,271 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම් (රු). | බිල්කළ ආදායම (රු). | රැස්කළ ආදායම (රු). | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). | ඇස්තමේන්තු ගත ආදායම (රු). | බිල්කළ ආදායම (රු). | රැස්කළ ආදායම (රු). | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු). |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| වරිපනම් හා බදු | 122,200 | 114,307 | 97,474 | 158,037 | 118,550 | 110,901 | 106,868 | 148,593 |
| කුලී | 13,373 | 13,752 | 14,504 | 2,313 | 11,767 | 11,250 | 11,866 | 3,132 |
| බලපත්‍ර ගාස්තු | 21,450 | 21,228 | 21,228 | 2,933 | 11,455 | 20,504 | 20,686 | 2,933 |
| වෙනත් ආදායම් | 642,832 | 507,038 | 509,751 | 114,719 | 618,510 | 561,904 | 560,255 | 95,940 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන ආදායමින් සියයට 17.84 ක් ද අයවැයගත ප්‍රාග්ධන ආදායමෙන් සියයට 85.66 ක් ද උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ උපයා නොගත් මුළු ආදායම රු. 400,095,273 ක් විය.

**2.2.3 වරිපනම් හා බදු**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 154,809,101 ක් වූ අතර එහි රු.50,000 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 162 කින් අයවිය යුතු රු. 69,557,291 ක මුදලක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට බිල්කළ වරිපනම් රු. 101,366,060 ක් වුවද ඉන් රු. 41,298,410 ක් හෙවත් සියයට 41 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 142,331,668 ක් වුවද ඉන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 39,198,739 ක් හෙවත් සියයට 28 ක් අයකර ගෙන තිබූ අතර රු. 103,132,929 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.2.4 කුලී**

(අ) සභාව සතු බදු දිය හැකි දේපල 282 කින් සමාලෝචිත වර්ෂය තුළ දේපල 271 ක් බදු දී තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 2,416,341 ක් වූ සමුච්චිත හිඟ ශේෂය තුළ ඇතුළත් වසර ගණනාවක සිට පැවත එන රු. 1,418,207 ක ශේෂය අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

(අ) 2017 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කල යුතුව තිබූ වෙළඳසැල් සංඛ්‍යාව 3092 ක් වුවද 2017 දෙසැම්බර් 31 දිනට වෙළඳසැල් 810 කට බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්ට අදාළව ලැබිය යුතු හිඟ බලපත්‍ර ආදායම රු.2,933,175 ක් සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

**(අ) කර්තව්‍යයන් ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(i) කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඇස්තමේන්තු වටිනාකම රු. 577,558 ක් වූ ව්‍යාපෘති 02 ක වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.

(ii) දේශීය මූලාකරණ ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කළයුතු රු.24,072,859 ක් වටිනා ව්‍යාපෘති 36 ක් හා පොදු අරමුදල් ව්‍යාපෘති 15 ක් නිම කර නොතිබුණි.

**(ආ)  ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

(i) 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 7,883,750 ක කසළ බදු හිඟයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 1,725,750 ක් අයකර ගෙන තිබුණද හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රතිශතය සියයට 21.89 ක් වැනි දුර්වල මට්ටමක පැවතුණි.

(ii) 2017 වර්ෂය තුළ වෙන් කරන ලද කසළ ටොන් 16,074 ක් හා වෙන් නොකරන ලද කසළ ටොන් 12,451 ක් කරදියාන කසළ අංගනයට භාර දී තිබුණු අතර කසළ එකතු කිරීම නිසි පරිදි කළමනාකරණය නොකිරීම නිසා මිශ්‍ර අපද්‍රව්‍ය වෙනුවෙන් රු.8,519,220 ක් වැඩිපුර ගෙවීමට සභාවට සිදුව තිබුණි.

(iii) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කසළ ආදායම රු. 12,052,900 ක් වුවද ඉන් රු.6,158,000 ක් පෙර වර්ෂයන්ට අදාළ හිඟ වටිනාකම් විය.

(iv) අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) විසින් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු හිඟ මුදලක් ලෙස සභාව වෙත දන්වා තිබූ නමුත් සභාවේ පොත්වල සටහන් නොවූ රු. 22,063,395 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් නිරවුල් කර නොතිබුණි.

**3.2  කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

(අ) එක් එක් ආදාහනාගාර සඳහා නිකුත් කළ ගෑස් ප්‍රමාණය හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් සභාව විසින් පවත්වාගෙන ගොස් නොතිබූ අතර කිලෝ ග්‍රෑම් 37.5 ක ගෑස් සිලින්ඩරයකින් පිළිස්සිය හැකි මෘත දේහ ප්‍රමාණය කොපමණද යන්න පරීක්ෂා කිරීමකින් තොරව ඉල්ලුම් කරන ලද ගෑස් ප්‍රමාණය සුසාන භූමි සේවකයන් වෙත නිකුත්කර තිබුණි.

(ආ) 2009, 2010 හා 2011 යන වර්ෂයන්ට අදාල එකතු කළ අගය මත බදු වාර්තාවන් නියමිත දිනයට ඉදිරිපත් නොකිරීම නිසා රු. 10,818,002 ක දඩ මුදලක්ද සමඟ රු.31,059,351 ක පැහැර හරින ලද එකතු කළ අගය මත බදු මුදලක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවන ලෙස 2014 හා 2015 වර්ෂවලදී සභාවට නියෝග කර තිබුණද ඉදිරිපත් කරන ලද අභියාචනාවලට අනුව බදු වගකීමෙන් සභාව නිදහස්කර නොතිබුණි.

(ඇ) 2012 ජුලි 11 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) අංක WP/LGD/01/2012 දරන චක්‍රලේඛය අනුව සැලසුම් කමිටු කාර්යයන් සම්බන්ධයෙන් මාසික ප්‍රගති වාර්තාවක් සකස් කර එම වාර්තාව අනුගාමී මාසයේ මාසික සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 17 | 04 | - |
| තෘතියික මට්ටම | 06 | 04 | 02 | - |
| ද්විතීය මට්ටම | 233 | 185 | 48 | - |
| ප්‍රාථමික මට්ටම | 733 | 680 | 53 | - |
| වෙනත් | - | 132 | - | 132 |
| එකතුව | 993 | 1018 | 107 | 132 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 107 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක පුරප්පාඩු පැවතීම හේතුවෙන් සභාවේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) ගිනි නිවන අංශයේ වගකිව යුතු සේවා කාණ්ඩ 02 කට අයත් නිලධාරීන් 03 ක් වර්ෂය පුරා පුරප්පාඩුව පැවතුණි.

(ඈ) බෙහෙත් ශාලා සහයක තනතුරු, 2013 ජනවාරි 01 දින සිට අනුමත කාර්ය මණ්ඩලයෙන් ඉවත් කර තිබුණද එම තනතුරේ සේවය කරන සේවකයන් 08 දෙනෙකු සඳහා රු. 3,651,088 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

(ඉ) ගරාජ් පරිපාලක හා ආයුධ භාරකරු තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවන නමුත් එම තනතුරුවල නිරත වන සේවකයන් දෙදෙනෙකු වෙනුවෙන් රු.814,789 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

(ඊ) සුසාන භූමි කාර්ය මණ්ඩලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 09 ක් වුවද ආදාහනාගාර ක්‍රියාකරු තනතුරක් සහ ආදාහනාගාර භාරකරු තනතුරක් පුරප්පාඩුව පැවතුණි.

(උ) වැඩ තහනම් කළ හා විශ්‍රාම ගිය නිලධාරින් 79 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 2,341,855 ක් වූ අතර එම ශේෂය තුළ ඇතුලත් නිලධාරින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 751,957 ක ණයශේෂ වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ඌ) අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුලත් නිලධාරින් 128 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 1,573,647 ක් වූ අතර එම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) ඩෙංගු මර්දන වැඩසටහන්**

-----------------------------

(i) නගර සභා බල ප්‍රදේශය සඳහා ඩෙංගු රෝග මර්දන ක්‍රියාකාරී සැලැස්මක් 2017 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර නොතිබූ අතර 2016 වර්ෂයේදී 165 ක්ව පැවති ඩෙංගු කීට ස්ථාන සංඛ්‍යාව සමාලෝචිත වර්ෂයේදී 814 ක් දක්වා ඉතා සීඝ්‍ර ලෙස වැඩි වී තිබුණි.

(ii) පෙර වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ නිකුත් කරන ලද රතු නිවේදන සංඛ්‍යාව 435 සිට 1571 දක්වාත් මදුරුවන් හමු වූ ස්ථාන සඳහා පවරන ලද නඩු සංඛ්‍යාව 155 සිට 712 දක්වාත් වැඩි වී තිබුණ අතර සභා බල ප්‍රදේශය තුළ වාර්තා වී තිබූ රෝගීන් සංඛ්‍යාව 500 සිට 923 දක්වා සියයට 84.6 කින් වැඩි වී තිබුණි. එමෙන්ම 2015 සහ 2016 වර්ෂවල සභා බල ප්‍රදේශය තුළ ඩෙංගු රෝග මරණ වාර්තා වී නොතිබූ නමුත් 2017 වර්ෂයේදී ඩෙංගු රෝග මරණ දෙකක් වාර්තා වී තිබුණි.

**(ආ) සභාව සතු ඉඩම් සහ සුසානභූමි**

-----------------------------------

(i) මොරටුව මහා නගර සභාව පරිහරණය කරන අක්කර 31 රූඩ් 03 පර්චස් 25.14 ට අදාළ සින්නක්කර ඉඩම් 114 ක ද, පවරාගත්, පරිත්‍යාග, බදු ඉඩම් සහ වෙනත් ඉඩම් ආදී වශයෙන් ඉඩම් 47 ක ද, සුසාන භූමි 05 ක ද අයිතිය තහවුරු කරගැනීමට අවශ්‍ය පවරා ගැනීම් විස්තර හෝ හිමිකම් ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) සභාවට අයත් පර්චස් 560.86 ක වපසරියකින් යුත් සුසාන භූමි 04 ක විස්තර ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබූ අතර ඉඩම් 06 ක බිම් ප්‍රමාණය කොපමණද යන්න හඳුනාගෙන නොතිබුණි.

(iii) ස්ථාවර වත්කම් ලේඛනය අනුව රාවතාවත්ත ප්‍රසිද්ධ සුසාන භූමිය සතු බිම් ප්‍රමාණය අක්කර 01 රූඩ් 02 පර්චස් 4.9 ක් වුවද විගණනයට ලබාදුන් තොරතුරු අනුව එකී බිම් ප්‍රමාණය අක්කර 03 රූඩ් 0 පර්චස් 14.05 ක් වූයෙන් බිම් ප්‍රමාණයෙහි අක්කර 01 රූඩ් 02 පර්චස් 9.15 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ඇ) පෙර පාසැල් කාර්යසාධනය**

-----------------------------

2013 සැප්තැම්බර් 04 දිනැති හා අංක 1826/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් IV වැනි කොටස මගින් ප්‍රසිද්ධ කරන ලද බස්නාහිර පළාත් සභාවේ 2013 අංක 01 දරන පෙර පාසැල් ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රකාරව පළාත තුළ ලියාපදිංචි කලයුතු පෙර පාසැල් 09 ක් ලියාපදිංචි කර නොතිබුණු අතර ප්‍රඥප්තියේ VII වැනි කොටස ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති ගුරුවරියන් 26 දෙනෙකු ලියාපදිංචි කර නොතිබුණි.

(ඈ) **දේපළ තක්සේරු කිරීම**

දේපළ වර්ෂ 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අය කිරීම කළ යුතු වුවද සභාව විසින් 2008 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි.

**3.5 වත්කම් කළමණාකරණය**

**3.5.1 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) නව ජෙනරේටරයක් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක තත්ත්වයේ පැවති ජෙනරේටරය 2010 ජූලි 28 දින සිට භාවිතයෙන් ඉවත්කර තිබූ නමුත් එය සභා පරිශ්‍රය තුළ නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යනු ලබන රු. 4,175,495 ක ශේෂයක් ඇති සාමාන්‍ය ඉතිරි කිරීමේ ගිණුමෙන් වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදුව නොතිබුණි.

(ඇ) වර්ෂ 01 සිට වර්ෂ 07 ක් අතර කාලපරිච්ඡේදයක් තුළ රු. 21,580,865 ක් වටිනා වාහන සහ යන්ත්‍ර උපකරණ 16 ක් හා වටිනාකම හඳුනානොගත් **වෙනත්** වාහන සහ අනෙකුත් වත්කම් 10 ක් වර්ෂ ගණනාවක සිට නගර සභා පරිශ්‍රය තුළ නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිතව පැවතුණි.

(ඈ) මධ්‍යම වෙළඳපොළ ගොඩනැගිල්ලේ දෙවන මහල 2010 ඔක්තෝබර් 31 දිනෙන් පසු බදු දීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ලුනාව ව්‍යාපෘතියෙන් ලද වාහන අමතර කොටස් වර්ග 26 කට අයත් ඒකක 154 ක් හා තවත් අයිතම් වර්ග 305 කට අයත් ඒකක 1277 ක් 2010 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) මොරටුව නගරයේ ඉදිකිරීම් සම්පූර්ණ කර නොමැති රංගන ශාලාව වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

(උ) සභාවට අයත් නිල නිවාස 4 ක් ප්‍රයෝජනයට නොගැනීම නිසා නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි.

(ඌ) ලුනාව සංවර්ධන ව්‍යාපෘතිය අවසන් වී තිබුණද එහි ශේෂය වූ රු. 6,820 ක් සාමාන්‍ය ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් 2017 සැප්තැම්බර් 13 දින සභාව වෙත ලබා දී තිබූ රු. 632,500 ක් වටිනා බේලිං යන්ත්‍රය ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

**3.5.2 වාහන උපයෝජනය**

(අ) මොරටුව මහා නගර සභාව සතු වාහන 04 ක අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) බාහිර ආයතන නමින් ලියාපදිංචි කර තිබූ වාහන 03 ක් හා වාහන ඇණිය තුළ පවතින UR Petrol සහ UR Diesel ගිනිරථ දෙක සභාව වෙත පිළිවෙලින් 1985 සහ 2006 වර්ෂවලදී ලැබී තිබුණද සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි.

(ඇ) මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන 2014, 2015 හා 2016 වර්ෂවල පරිවර්තනය කරන ලද වාහන 03 කින් ඉවත් කරන ලද උපාංග හා එන්ජිම ගබඩාවට භාරදුන් බව සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව වාහන 3 ක් විකුණූ බව සඳහන් කර තිබුණද එම වාහනවල ලියාපදිංචි සහතික විගණනයට ඉදිරිපත් කළ නමුත් වාහන විකුණූ බව සනාථ කිරීමට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 1951 අංක 14 දරන මෝටර් රථ පනතේ 25(1) වගන්තිය හා 99(1) වගන්තිය ප්‍රකාරව සභාව සතු වාහන සඳහා 2017 වර්ෂයේ ලබා ගත් ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**3.6 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

වරිපනම් ආදායම් කළමනාකරණය කිරීම සඳහා 2007 වර්ෂයේදී රු.850,556 ක් වැයකර පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදීගෙන සේවා ගිවිසුම් සඳහා වාර්ෂිකව රු.111,945 බැගින් ගෙවීම්කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිගණක මෘදුකාංගයෙන් ලබාගන්නා තොරතුරුවල පවතින අඩුපාඩු නිවැරදි කර ගැනීමට අවධානය යොමු කර නොතිබුණ

**3.7 හඳුනාගත් පාඩු**

------------------

කම්පැක්ටර් රථය අළුත්වැඩියා කිරීමට අදාළ ගිවිසුම අනුව ප්‍රමාද කාලය දින 85 ක් වෙනුවෙන් අයවිය යුතු රු. 255,000 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානයටත් අයකරගෙන නොතිබුණි.

**3.8 ප්‍රසම්පාදනය**

--------------

(අ) 2017 වර්ෂයට සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා රු. 137,085 ක වියදමක් දරා 2016 සැප්තැම්බර් 28 දින පුවත්පත් දැන්වීම් පළ කර තිබුණද අයිතමයන් 10 ක් සඳහා එක් සැපයුම්කරුවෙකු හෝ ලියාපදිංචි කර නොතිබූ අතර අයිතමයන් 18 ක් සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකුට අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කර තිබුණි.

(ආ) 2017 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයීමට ලියාපදිංචි නොවූ බාහිර සැපයුම්කරුවන් 7 දෙනෙකුගෙන් මිල කැඳවීම් කර රු. 639,998 ක් වටිනා අයිතම 4 ක් අවස්ථා 23 කදී මිලදී ගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම්වල සියයට 2.69 සිට සියයට 82.28 **දක්වා** විචලනයන් පැවැති අවස්ථා 16 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය**.**

(ආ) 2017 වර්ෂයේ අයවැයගත පුනරාවර්තන වියදමින් සියයට 19.68 ක් ද අයවැය ගත ප්‍රාග්ධන වියදමින් සියයට 82.28 ක් ද වර්ෂය තුළ දී උපයෝජනයකර නොතිබූ අතර උපයෝජනයකර නොතිබූ ප්‍රාග්ධන වියදම රු. 421,788,242 ක් විය.

(ඈ) වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුව අයවැය ප්‍රතිපාදන රු. 60,732,314 ක් වූ පුනරාවර්තන වියදම් ශීර්ෂ 150 කින් හා රු. 232,584,152 ක් වූ ප්‍රාග්ධන වියදම් ශීර්ෂ 38 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ශුද්ධ ප්‍රතිපාදනය රු. 96,342,879 ක් වූ පුනරාවර්තන වියදම් ශීර්ෂ 44 ක සත්‍ය වියදම රු. 119,287,141 ක් වූයෙන් රු.22,944,262 කින් අයවැය ප්‍රතිපාදන ඉක්මවා තිබුණි.

(ඉ) වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරුකිරීමෙන් අනතුරුව ශුද්ධ ප්‍රතිපාදනය රු. 8,824,848 ක් වූ ප්‍රාග්ධන වියදම් විෂයයන් 04 ක සත්‍ය වියදම රු. 30,434,037 ක් වූයෙන් රු. 21,609,189 කින් අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

---

අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු විධිමත්ව සංවිධානය කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

---

මහා නගර සභාව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 09 කට 2018 මැයි 12 දින වන විටද පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණු අතර එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 226,222,826 ක් විය. 2015 හා 2016 වර්ෂ සඳහා නිකුත් කළ විගණන විමසුම් 02 කට ද පිළිතුරු සපයා නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

---

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර කොමසාරිස්වරයාගේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | මූල්‍ය පාලනය | i. | සභාව සතු මුදල් ඵලදායි ලෙස ආයෝජනය නොකිරීම. |
| | | ii. | හානි හා පාඩු සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු නොකිරීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය නොකිරීම |
| | | ii. | බදු තක්සේරු නිසිකලට සිදු නොකිරීම. |
| (ඇ) | අයවැය පාලනය | i. | අවශ්‍යතාවයන් මත ප්‍රතිපාදන වෙන් නොකිරීම. |
| | | ii. | ආදායම් ඇස්තුමේන්තු තාත්වික නොවීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් හා තොග පාලනය | i. | ලේඛන පවත්වා නොතිබීම හා ලේඛන යාවත්කාලීන නොවීම. |
| | | ii. | වත්කම්වල ආරක්ෂාව වෙනුවෙන් නිසි පරිදි කටයුතු නොකිරීම හා වත්කම් ඵලදායී ලෙස කළමනාකරණය නොකිරීම. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | | විධිමත් අනුමැතියකින් තොරව බඳවා ගැනීම සිදු කිරීම. |
| (ඊ) | ණයගැති ණයහිමි පාලනය | | හිඟ ශේෂ නිරවුල් නොකිරීම. |